# 11 ශ්‍රේණිය - පිළිතුරු

## පාඩම - 16 නිමල දහම රකුණු අයුරු

1. මහා පරිනිර්වාන සූත්‍රය

2.

| | ප්‍රථම ධර්ම සංගායනාව | දෙවන ධර්ම සංගායනාව | තෙවන ධර්ම සංගායනාව | සිව්වන ධර්ම සංගායනාව |
|---|---|---|---|---|
| බුද්ධ පරිනිර්වාණයෙන් | තෙමසකට පසු | වසර සියයකට පසු | වසර 236කට පසු | ක්‍රි.පූ. පළමුවැනි සියවසේ |
| ප්‍රධාන හේතුව | සුභද්‍ර භික්ෂුනමගේ නුසුදුසු වචනය | වජ්ජිපුත්තක භික්ෂුන්ගේ අකැප දස වස්තුව | ලාභ අපේක්ෂාවෙන් දුසිල් භික්ෂූන් සසුන් ගත වීම | ත්‍රිපිටකධාරී මහතෙරුන් වහන්සේලා හා ධර්මය විනාශ වීමේ අවදානම |
| මූලිකත්වය | මහා කාශ්‍යප මහරහතන් වහන්සේ | සබ්බකාමී මහරහතන් වහන්සේ | මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ | |
| දායකත්වය | අජාසත්ත රජු | කාලාශෝක රජු | ධර්මාශෝක රජු | ප්‍රාදේශීය නායකයකු |
| ස්ථානය | රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණි ගුහා ද්වාරය අභියස | විශාලා මහනුවර වාලුකාරාමය | පැළලුප් නුවර අශෝකාරාමය | මාතලේ අළුවිහාරය |
| සහාය වූ පිරිස | උපාලි තෙරුන් වහන්සේලා | රේවත, සබ්බකාමී, යස, සාළ්හ, ඛුජ්ජිසෝභිත, වසභගාමී, සුමන, සානවාසී, සම්භූත තෙරුන් වහන්සේලා | මහින්ද මහාරක්ඛිත, මහාදේව තෙරුන් වහන්සේලා | |
| ගත වූ කාලය | මාස 7 | මාස 8 | මාස 9 | |
| සහභාගි වූ ප්‍රමාණය හා සංගායනාව හැඳින්වෙන නාමය | 500 පංචසතිකා සංගීතිය | 700 සත්තසතිකා සංගීතිය | 1000 සාහස්සිකා සංගීතිය | 500 පුස්තකාරූඪ සංගීතිය |

| ප්‍රතිඵල | 1. විසිරී තිබූ ධර්ම විනය එක්රැස් කර සම්මුතියකට ගෙන ඒම.<br>2. ධර්ම විනය කොටස්කර භාණක පරපුරකට පැවරීම.<br>3. නව විනය නීතිනොපැන වීමටත් පැන වූ විනය නීති ආරක්ෂා කිරීමටත් ප්‍රතිඥා දීම. | 1. විනය විරෝධී කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම.<br>2. අකැප දස වස්තුව ප්‍රතික්ෂේප කිරීම.<br>3. පළමු සංගීතියේ දී ඇති කරගත් සම්මුතිය අනුව ශික්ෂාපද ලිහිල් නොකර ඉදිරියට පවත්වා ගෙන යාම.<br>4. අටළොස් නිකාය බිහිවීම. | 1. දුසිල් මහණුන් හැටදාහක් සුදුවත් හඳවා සසුනෙන් නෙරපා හැරීම.<br>2. ශාසනික පිළිවෙත් නැවත ආරම්භ කිරීම.<br>3.කථාවත්ථුප්පකරණය ඇතුළත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම.<br>4. ත්‍රිපිටකය ම අංග සම්පූර්ණ වීම.<br>5. දේශීය විදේශීය ධර්ම ප්‍රචාරය | 1. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම. |
|---|---|---|---|---|

3.

| සූත්‍ර ධර්ම නිකාය වශයෙන් | භාණක පරපුර |
|---|---|
| 1. දීඝ නිකාය | ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව |
| 2. මජ්ඣිම නිකාය | සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව |
| 3. අංගුත්තර නිකාය | අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව |
| 4. සංයුක්ත නිකාය | මහාකාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව |
| 5. ඛුද්දක නිකාය | සියලු ම භික්ෂූන් වහන්සේලාට |

4. ■ කුඩා, අනුකුඩා ශික්ෂාපද සම්මුතිය අභිබවා යමින් වජ්ජිපුත්තක භික්ෂූන් සම්මත කොටගත් දස අකැප වස්තු පාචීනක හා පාවෙය්‍යක යන දෙපාර්ශ්වයට ම අයත් භික්ෂූන්ගෙන් සමන්විත කමිටුවක් විසින් සලකා බලන ලදුව ඒවා ධර්ම විනයට අනුකූල නොවන බව තීරණය කිරීම

■ තත්කාලීන ව සසුනේ විසූ වගකිව යුතු මහ රහතන් වහන්සේලා ප්‍රධාන ථේරවාදී භික්ෂූන් ''විනය සසුනේ ආයුෂය වේ'' යන පිළිගැනීම මත දස වස්තුව අකැප බව ප්‍රකාශයට පත් කිරීම

■ අකැප දසවස්තුව පිළිගත් දුර්මතධාරී වජ්ජිපුත්තක භික්ෂූන් දස දහසක් සසුනින් ඉවත් කර සංඝ සංශෝධනයක් සිදු කිරීම

■ නිර්මල ධර්ම විනය ගරුකළ භික්ෂු පරපුර ථේරවාදී වශයෙන් වෙන ම සම්ප්‍රදායක් ලෙස සංවිධානය වීම.

■ දස වස්තුව පිළිගත් සසුනින් නෙරපන ලද භික්ෂූන් මහා සාංඝික නමින් වෙන ම සංවිධානයක් පිහිටුවා ගැනීම ද දෙවැනි ධර්ම සංගායනාවේ දී සිදුවිය.

5 ■ අධර්මවාදීන් සසුනෙන් නෙරපා ශාසන ශෝධනයක් ඇති කිරීම.

■ පරවාද පන්සියයක් හා ඒවා ඛණ්ඩනය කිරීම සඳහා වන සකවාද පන්සියයක් ද ඇතුළත් කර කථාවත්ථුප්පකරණය නම් ග්‍රන්ථය මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ විසින් සම්පාදනය කිරීම.

■ අභිධර්ම පිටකය ප්‍රකරණ හතක් බවට පත් කිරීම.

■ ශාසනික තත්ත්වය අවුල් සහගත වීම හා භික්ෂු වෙස් ගත්තවුන් බහුල වීම ද නිසා සිල්වත් භික්ෂූන් වහන්සේලා වසර හතක් පොහොය කර්මාදී පිළිවෙත් සිදු නොකළ අතර නැවත පොහොය කර්මාදිය සිදු කිරීමට ඉඩ සැලසුණේ ද මේ සංගායනාවෙන් පසුව වීම.

■ ධර්මාශෝක රජතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය අනුව ථේරවාදී බුදුදහම රටවල් 9 කට ව්‍යාප්ත කරවීම.

6.

| | ප්‍රදේශය | නායකත්වය | ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය හෝ කථා වස්තුව |
|---|---|---|---|
| 1 | කාශ්මීර ගන්ධාරය | මජ්ඣන්තික තෙරුන් වහන්සේ | ආසිවිසෝපම සූත්‍රය |
| 2 | මහිස මණ්ඩලය | මහාදේව තෙරුන් වහන්සේ | දේවදූත සූත්‍රය |
| 3 | වනවාසී දේශය | රක්ඛිත තෙරුන් වහන්සේ | අනමතග්ග සංයුත්තය |
| 4 | අපරන්ත දේශය | යෝනක ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ | අග්ගික්ඛන්ධෝපම සූත්‍රය |
| 5 | මහාරට්ඨ | මහා ධම්ම රක්ඛිත තෙරුන් වහන්සේ | මහානාරද කස්සප ජාතකය |
| 6 | යෝනක රට්ඨ | මහා රක්ඛිත තෙරුන් වහන්සේ | කාලකාරාම සූත්‍රය |
| 7 | හිමවන්ත ප්‍රදේශය | මජ්ඣිම තෙරුන් වහන්සේ | ධම්මචක්කප්පවත්තන සූත්‍රය |
| 8 | ස්වර්ණභූමිය | සෝණ, උත්තර යන තෙරුන් වහන්සේලා | බ්‍රහ්මජාල සූත්‍රය |
| 9 | තම්බපණ්ණිය (ශ්‍රී ලංකාව) | මිහිඳු මහරහතන් වහන්සේ | චූලහත්ථිපදෝපම සූත්‍රය |

7.■ ධම්මසංගණිප්පකරණය

■ විභංගප්පකරණය

■ ධාතුකථාප්පකරණය

■ පුද්ගලපඤ්ඤත්තිප්පකරණය

■ පට්ඨානප්පකරණය

■ යමකප්පකරණය

■ කථාවත්ථුප්පකරණය



සැකසුම - වයි. පී. පී කවිසිගමුව
ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර

8. ■ ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම.

■ පර්යාප්තිය හෙවත් ත්‍රිපිටක බුද්ධ වචනය ආරක්ෂා කර ගැනීමට මුල්තැන දිය යුතු ය යන ආකල්පය සමාජ ගත වීම.

■ පසුකාලීන ථේරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත ස්ථාපිත කිරීමට මෙම ග්‍රන්ථ උපකාරී වීම.

■ ලෝකයේ වෙනත් රටවල ථේරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත ස්ථාපිත කිරීමට සුරක්ෂිත ව පැවැති ලාංකේය ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.

■ බුදු දහම ව්‍යාප්ත නොවූ බටහිර රටවල පසු කාලයේ ඒ පිළිබඳ දැනුම බෙදාහැරීමට මෙම ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.

■ එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවීම හා එමගින් පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කොට බෙදාහැරීමට හැකි වීම. මෙය පසුකාලීන ප්‍රතිඵලයකි.



සැකසුම - වයි. පී. පී කවිසිගමුව
ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර